# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1756/27 - 2012 මැයි 04 වැනි සිකුරාදා - 2012.05.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

එල්. ඩී. බී. 3/2006.

**2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත**

මූල්‍ය බුද්ධි ඒකකය විසින් 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තිය යටතේ සාදනු ලබන රීති.

මූල්‍ය බුද්ධි ඒකකය,
(අත්සන් කළේ මූල්‍ය බුද්ධි ඒකකය සඳහා සහ
එය වෙනුවෙනි).

2012 මැයි මස 04 වැනි දින,
කොළඹ දී ය.

රීති

2011 මාර්තු මස 28 වැනි දින *අංක 1699/10 අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2011 අංක 1 දරන බලපත්‍රලාභී බැංකු සහ ලියාපදිංචි මූල්‍ය සමාගම් ගනුදෙනුකරු හඳුනා ගැනීමේ (KYC) සහ ගනුදෙනුකරු පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියාකිරීමේ (CDD) රීති පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි I වැනි කොටසේ 8 වැනි රීතිය ඉවත්කර පහත දැක්වෙන රීතිය ආදේශ කිරීමෙන් :-

"8. සෑම මූල්‍ය ආයතනයක් විසින්ම එකවර හෝ වරින්වර සිදු කරනු ලබන ගනුදෙනු සම්බන්ධයෙන්, ගනුදෙනුවක හෝ එකිනෙකට සම්බන්ධිත ගනුදෙනු මාලාවක මුදල් ප්‍රමාණය රුපියල් ලක්ෂ දෙක ඉක්මවන විට මේ රීතිවල 4 වැනි රීතියේ සඳහන් අවම තොරතුරු ලබාගත යුතු ය ඃ

එසේ වුව ද, ගනුදෙනුව හෝ එකිනෙකට සම්බන්ධිත ගනුදෙනු මාලාව සැක සහිත බවට හෝ අසාමාන්‍ය බවට සැක කිරීමට මූල්‍ය ආයතනයට සාධාරණ හේතු ඇත්නම්, මූල්‍ය ආයතනය විසින් ඉහත නිශ්චිතව සඳහන් මුදල පිළිබඳ සැලකිල්ලක් නොදක්වා එම අවම තොරතුරු ලබාගත යුතු ය. " ; සහ

1A - G 15990— 355 (2012/05)

(2) එහි II වැනි කොටස් 34 වැනි රීතියේ "ගිණුම් පවත්වාගෙන යාම" යන ශීර්ෂය යටතේ :-

(අ) එහි 6 වැනි ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"6. යම් අපේක්ෂිත ගණුදෙනුකරුවෙකුගේ නම අදාළ බලධාරීන් විසින් කලින් කල නිකුත් කරන ලද යම් හඳුනාගත් හෝ සැකසහිත ත්‍රස්තවාදී ලැයිස්තුවක හෝ විමසිලිමත්වීමේ ලැයිස්තුවක සඳහන්ව ඇත් ද යන්න සෑම මූල්‍ය ආයතනයක් විසින්ම සත්‍යායනය කළ යුතු ය"

(ආ) එහි 13 වැනි ඡේදයේ "13 තුන්වන පාර්ශවයන් විසින් ඉතිරි කිරීමේ සහ/හෝ ජංගම ගිණුම්වල තැන්පත් කරනු ලබන මුදල් තැන්පතු සම්බන්ධයෙන් " යන වචන සහ ඉලක්කම් වෙනුවට "13. තුන්වන පාර්ශව විසින් ඉතිරි කිරීමේ හෝ ජංගම ගිණුම්වල තැන්පත් කරනු ලබන රුපියල් ලක්ෂ දෙකක් ඉක්මවන මුදල් තැන්පතු සම්බන්ධයෙන් " යන වචන සහ ඉලක්කම් ආදේශ කිරිමෙන්.

05-501

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.